**පොල් සංවර්ධන අධිකාරිය - 2021**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

පොල් සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වල ටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන්උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්ථිත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කළ හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත ආදායම හා ආදායම් විචලනය සඳහන් කර නොතිබුණි. | 2022 වසරේ සිට ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කිරීමට කටයුතු කර ඇත. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය කරමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුයි. |
| (ආ) සමුච්චිත අතිරික්තයට ගලපන ලද පෙර වර්ෂ ගැලපීම් රු.1,474,281 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයට ගලපා තිබීමත්, මාස 03 න් කල් පිරෙන රු.376,499,131 ක ස්ථාවර තැන්පතු 20 ක්, රු.11,237,375 ක භාණ්ඩාගාර බිල්පත් 06 ක් සහ රු.71,963,410 ක ඉතුරුම් ගිණුම් 03 ක් මුදල් හා මුදල් සමාන ද ලෙස නොදක්වා ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි නියමයන්ට අනුකූල ලෙස පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය. | මෙම වරද නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රමිතියෙහිනියමයන්ට අනුකූල ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.88,827,013 ක් වූ රසායනාගාර උපකරණ සහ යන්ත්‍රෝපකරණ දැනටමත් භාවිතයට ගනිමින් පැවතියද එම වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය සිදු නොකරන ලද වත්කම් තක්සේරු කිරීම සඳහා කමිටු පත් කර ඇත.2022 වසරේ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට නියමිතය. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් භාවිතයට ගනිමින් පවතින වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතා කිරීමට අරමුණු කරගත් කාර්යය සඳහා යෙදවීම ආරම්භ කළ විට එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, 2011 ත් 2018 ත් අතර කාලය තුළ මිලදීගෙන අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබුණු HPLC උපකරණය ඇතුළුව පිරිවැය රු.17,714,910ක් වූ උපකරණ 12 ක් මිලදීගත් වර්ෂයේ සිට වාර්ෂිකව සියයට 20 ක් බැගින් ක්ෂය කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට භාවිතයට නොගත් යන්ත්‍ර උපකරණ 08 ක අගය ශුන්‍ය වී තිබුණු අතර වත්කම් හා සමුච්චිත අතිරික්තය රු.12,577,364 ක් බැගින් අඩුවෙන් ද, වියදම රු.3,205,365 ක් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව මෙම වත්කම් මිලදී ගත් වර්ෂයේ සිට වාර්ෂිකව සියයට 20 ක් බැගින් ක්ෂය කර ඇත. | ප්‍රමිතියෙහි උපදෙස් ප්‍රකාරව වත්කමක් භාවිතා කිරීමට අරමුණු කරගත් කාර්යය සඳහා යෙදවීම ආරම්භ කළ විට එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 හි 33 ඡේදය ප්‍රකාරව ගනුදෙනුව හා ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා අස්ථිත්වයට ගලා එන බවට හව්‍යතාවයක් ඇති විට හා අයහාරයේ ප්‍රමාණය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට ඒවා පොලී ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත්, වසර 36 ක් තිස්සේ අය නොවන බී.සී.සී. ලංකා සමාගමේ රු.26,715,037ක ණය ශේෂය සඳහා වාර්ෂිකව රු.4,011,609 ක් බැගින් පොලී ආදායමක් ගණනය කර එම වටිනාකම අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි. මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමටත්, ණය ශේෂය සඳහා වන හානිකරණ අගය වෙනුවෙන් අවශ්‍ය ගැලපීම් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | මෙම ණය හා පොලී මුදල් බීසීසී ලංකා සමාගම විසින් පොල් සංවර්ධන අධිකාරියට ගෙවන බවට දිගින් දිගටම භාණ්ඩාගාරය හරහා දැනුම් දී ඇති බැවින් අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නැත. | අය නොවන ණය හා පොලී ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමටත්, ණය ශේෂය සඳහා වන හානිකරණ අගය වෙනුවෙන් අවශ්‍ය ගැලපීම් කිරීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වටිනාකම් රහිතව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ පවත්නා යන්ත්‍රෝපකරණ 16 ක්, පරිගණක හා උපාංග 17 ක්, ලී බඩු උපකරණ 04 ක් හා වෙනත් වත්කම් 65 ක් ඇස්තමේන්තු කර ගිණුම්වලින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම ලේඛනයට 2022 වසරේදී යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. | අදාළ ස්ථාවර වත්කම් ඇස්තමේන්තු කර ස්ථාවර වත්කම් ලේඛනයට ගැලපීම් කර ගිණුම්වලින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට ලිපිද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝජන ද්‍රව්‍ය පිළිබඳ භෞතික තොග සමීක්ෂණයක් සිදුකර තිබුණු නමුත් එම වාර්තාවේ ඇතුළත් තොග අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පෙර ලැබීම් පෙර නිකුත් කිරීම් (FIFO)ක්‍රමයට අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්පොත් අනුව ශේෂය වූ රු.21,501,463 ක නිවැරදිතාවය සනාථ කරගත නොහැකි විය. | භෞතික තොග සමීක්ෂණ වාර්තා 2022.02.28 දින වන විට නිකුත් වී නොතිබුණු බැවින් තොග ලෙජර් ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලටඇතුළත් කර ඇත. | භෞතික තොග සත්‍යාපන ශේෂයන්හි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රධාන කාර්යාල ගබඩාවේ තොගයෙන් ඉවත් කර අදාළ අංශවලට නිකුත් කළ රු.2,962,845 ක් වටිනා ස්ටිකර් 1,649,010 ක් හා වර්ග 105 කට අයත් රු.8,427,201 ක් වටිනා රසායන ද්‍රව්‍ය, වීදුරු උපකරණ හා මාධ්‍ය උපකරණ තොග 2021 දෙසැම්බර් 31 දිනට එම අංශයන්හි ඉතිරි වී තිබුණු නමුත් ඒවා භෞතිකව සමීක්ෂණය කර තොගයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් රු.11,390,046 කින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොගය අඩුවෙන් ද, වියදම වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙම තොග ඉදිරියේදී විධිමත් ලේඛනගත කිරීමකින් කළමණාකරනය කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති අතර මෙලෙස ගබඩාවෙන් එකවර උප තොග ලබා ගැනීම සීමා කරන ලෙසත් දැනුම් දී ඇත. ඒ අනුව ඉදිරියේදී තොග අඩු වීම සිදු නොවීමටත්, මෙම තොගය භෞතිකව සමීක්ෂණය කර තොගයට ගැලපීමටත් කටයුතු කරනු ලැබේ. | වර්ෂය අවසානයට සියලුම ඉතිරි තොග භෞතිකව සමීක්ෂණය කර තොගයට ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) රසායන වර්ග 11 ක් කේත කීපයක් යටතේ ගබඩා දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති බවට ගබඩා ලෙජර් ගිණුම් හා භෞතික තොග සමීක්ෂණ වාර්තා නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වීමෙන් එම රසායනික ද්‍රව්‍යයන්හි තොග ලැබීම් හා නිකුත් කිරීම් නිවැරදිව ගිණුම්ගත නොවන බවට නිරීක්ෂණය විය. | කමිටුවක් පත්කර කේත සම්බන්ධයෙන් පැවති ගැටලුව නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | එක් රසායන වර්ගකට එක් කේතයක් බැගින් වන දත්ත පද්තියක් සකස් කරගත යුතුය. |
| (ඉ) දිසිදි පොල් මෝල් හිමියන්ට සේවා සැපයීම හා මුදල් අය කිරීම සඳහා ඉන්වොයිස් නිකුත් කර නොතිබීම, ණයගැති ලෙජරයක් හා ණයගැති පාලන ගිණුමක් පවත්වා නොතිබීම, මුදල් අයකර ගැනීමේ නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම, බැංකුවට සෘජුව බැර කරන මුදල් හඳුනා ගැනීමේ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් නොතිබීම යනාදී කරුණු අනුව විකුණුම් හා ණයගැතියන් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් පවතින බවටත්, ණයගැතියන් හා ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකර ඇති බවටත් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු.11,057,590 ක් ද, ණයගැති ශේෂය රු.5,104,468 ක් ද වූ අතර ආදායම රැස් කරන අංශය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව එම ආදායම රු.9,794,902 ක් ද, ණයගැති ශේෂය රු.4,377,852 ක් ද විය. | ඉන්වොයිස් පිටපත ගිණුම් අංශය වෙත නිසි පරිදි නොලැබීම මත මෙම වැරදි හා අඩුපාඩු සිදුවී ඇති අතර ඒවා නිවැරදි කර ගැනීමට පියවර ගෙන ඇත.දිසිදි මෝල් හිමියන්ට සේවා සපයන අවස්ථාවේදීම ඉන්වොයිස්පතට අදාළව ගෙවීම් කර රිසිට්පත් ද සමඟ සාම්පලය භාරගෙන දත්ත පද්ධතියට ඇතුළත් කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන බවත් හිග ගාස්තු අය කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | විකුණුම් හා ණයගැතියන් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් ඇති කර ණයගැතියන් හා ආදායම නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඊ) මූල්‍ය ප්‍රකාශනවල “Receipt In Advance” වශයෙන් ජංගම වගකීම් යටතේ පැවති රු.2,391,232 ක හඳුනා නොගත් ශේෂ අතරින් පිළිවෙලින් රු.335,750 ක්, රු.460,627 ක් හා රු.912,000 ක් වශයෙන් එකතුව රු.1,708,377 ක් 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළව ගනුදෙනුකරුවන් විසින් කෙලින්ම බැංකුවේ තැන්පත් කරන ලද පරීක්ෂණ ගාස්තු හා ලියාපදිංචි ගාස්තු ආදායම් බවට නිරීක්ෂණය විය. එසේ | ඇතැම් ගනුදෙනුකරුවන් විසින් බැංකුව වෙත සිදු කරන සෘජු ප්‍රේෂණ සම්බන්ධව කිසිදු විස්තරයක් ඉදිරිපත් නොකිරීම හෝ සැලකිය යුතු කාලයක් ගතවන තුරු යොමු නොකිරීම මෙයට හේතුව වේ ඉදිරියේදී . මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතුකරනු ඇත. | නොපමාව මෙම ශේෂ හඳුනා ගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. බැංකුවට බැරවන ශේෂය මාසිකව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපන කළ යුතුය. |

වුවත් මෙම ශේෂයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල ගලපා නොතිබීම හේතුවෙන් රු.1,708,377 කින් ජංගම වගකීම් වැඩියෙන් දැක්වුණු අතර සමාලෝචිත වර්ෂයේ ආදායම රු.460,627 කින්, සමුච්චිත අතිරික්තය රු.335,750 කින් හා ඉදිරියට ලැබීම් රු.912,000 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලදැක්වුණි.

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ණයහිමියන් 20 දෙනෙකුට ගෙවිය යුතු මුදල් | 70,527,249 | ශේෂ සනාථ කිරීම් | සියලුම ණයගැතියන් වෙත ශේෂ තහවුරු කරන ලෙස ලිපි යවා ඇත . | ශේෂ සනාථ කිරීම් මඟින් ණයගැතියන් හා ණයහිමියන්ගේ පැවැත්ම තහවුරු කළ යුතුය. |
| (ආ) ණයගැතියන් 92 ක ගෙන් අයවිය යුතු මුදල් | 15,236,329 | ශේෂ සනාථ කිරීම් | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය යටතේ ඇති පොල් තෙල් මිල ස්ථායීකරණ අරමුදලෙන් හා ප්‍රාග්ධන සංවර්ධන අරමුදලෙන් B.C.C ලංකා සමාගමට 1985 වර්ෂයේ දී ලබාදී තිබුණු ණය රු.26,715,037 ක් හා 2002 හා 2004 වර්ෂයන්හිදී ලබාදී තිබුණු ණය රු.31,550,000 ක් සහ ඊට අදාළ පොලී මුදල් රු.56,162,526 ක් වශයෙන් එකතුව රු.114,427,563 ක් වසර 36 කට අධික කාලයක් තිස්සේ හිඟහිටව ඇති අතර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බී.සී.සී. ලංකා සමාගම විසින් බුක්ති විඳින ඉඩමක් අධිකරණ අමාත්‍යාංශය වෙත පවරාදීමෙන් ලබාගන්නා වන්දි මුදලින් එම ණය හා පොලී මුදල් පියවීමට 2022 ජනවාරි 26 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී එකඟ වී ඇත. | නොපමාව අයවිය යුතු ණය හා පොලී අයකර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018, 2019 හා 2020 වර්ෂවලදී දිසිදි පොල් නියැදි පරීක්ෂාවන් සිදුකර සහතික නිකුත් කර තිබුණු මෝල් හිමියන් 33 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,321,138 ක්, දිසිදි නිෂ්පාදන සඳහා ලියාපදිංචි සහතික ලබා නොගත් මෝල් 15 කින් අයවීමට ඇති රු.1,119,599 ක් හා පොල් කිරි නිෂ්පාදන ආයතන 13 කින් අයවිය යුතුව පැවති රු.145,144ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් ඍජු තැන්පතු ලෙස ගෙවා ඇති බව අදාළ ආයතන විසින් සඳහන් කර ඇති අතර ඒ පිළිබඳව පරීක්ෂා කරමුදල් ගෙවීමක් සිදුවී නැති නම්, එම මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කෙරේ. | අයවිය යුතු මුදල් නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, පරීක්ෂණ සිදු කිරීමට පෙර අදාළ ගාස්තු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයන් සකස් කළ යුතුය. |

## 1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

| නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1971 අංක 38 දරන මුදල් පනතේ 11 (ආ) වගන්තිය, 2004 ජූනි 29 දිනැති අංක 25 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2006 ජූනි 27 දිනැති අංක PE/PE/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යවසායන්හි මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 40 ක ආයෝජිත රු.739,847,663 ක් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මින් ඉදිරියට යම් ආයෝජනයක් සිදු කිරීමට පියවර ගැනීමට පෙර අදාළ එකඟතාවයන් හා අනුමැතීන් ලබාගැනීමට පියවර ගනු ඇත. | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 හා 13.7 ඡේද | පුරප්පාඩු වී ඇති තනතුරක් සඳහා පූර්ණ කාලීන නිලධාරියෙකු නොපමාව පත් කළ යුතු අතර, රාජකාරි ආවරණය කිරීමේදී එම නිලධාරියාට අතිරේක පරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නොමැත. එසේ වුවද, අධිකාරියේ අධ්‍යක්ෂ (පරිපාලන) ඇතුලු තනතුරු 03 ක රාජකාරි ආවරණය කිරීම සඳහා නිලධාරීන් 03 දෙනෙකු වසර 02 යි මාස 03 ක්, වසර 02 යි මාස 08 ක් හා වසර 03 යි මාස 04 ක සිට පත් කර ඒ සඳහා මාසයකට රු.29,201 ක් බැගින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.924,220 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. | 2019 හා 2020 වර්ෂයන්හි පැවති මැතිවරණයන් නිසා බඳවා ගැනීම් අත්හිටුවා තිබීමත්, අනතුරුව සුදුසු අයදුම්කරුවෙකු නොමැති වීමත් නිසා බඳවා ගැනීමට නොහැකි විය. මේ වන විට බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම සඳහා යොමු කර ඇත.මෙම තනතුරු 03 සඳහා රාජකාරි ආවරණය කිරීම යන්න රාජකාරි ඉටුකිරීම යනුවෙන් නිවැරදි කර දීමනාව ගෙවීමටහෝ එසේ නොහැකි නම් මුදල ආපසු අය කර ගැනීමට කටයුතු කරනු ඇත.ගෙවීම් අත්හිටුවීමට දන්වා ඇත. | නීති විරෝධි ගෙවීම් අත්හිටුවීම හා ගෙවන ලද නීති විරෝධි මුදල් අයකර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ.371 | ලබාගත් අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 18කදී නිලධාරීන් 15 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.801,990ක අත්තිකාරම් පියවීමට දින 30ත් 246 ත් අතර කාලයක් ගත කර තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇත. ඉදිරියේදී වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු බවට නිලධාරීන් දැනුවත් කර ඇත. | ලබාගත් අතුරු අග්‍රිම කාර්යය අවසන් වූ වහාම පියවිය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**
---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 18,945,738 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තයරු.18,194,029 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,139,767 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මුලු වියදම රු.24,561,068 කින් පහළ ගිය ද, ආදායම රු.56,527,308 කින් පහළ යාම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**
------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**
------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ 2019 වර්ෂයේ දී රු.4,092,743 ක් ගෙවා සිදු කළ විදුලි අලුත්වැඩියා කටයුතු නිසි ලෙස සිදු නොකිරීම හේතුවෙන් ඒ සඳහා නැවතත් 2021 වර්ෂයේ දී රු.1,400,200 ක මුදලක් දැරීමට සිදු වී තිබුණි. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය, උපදේශන සේවාව හා නිර්දේශ මත අවශ්‍ය විදුලි ධාරිතාව 300KVA දක්වා වැඩි කිරීම මත අභ්‍යන්තර විදුලි රැහැන් හා පරිපථ පුවරු අලුත්වැඩියා කිරීම, නව විදුලි පරිපථ පුවරු යෙදීම, රසායනාගාර උපකරණ ස්ථාන ගත කිරීම් අනුව නව විදුලි පේනු සවි කිරීම් සිදු කර ගෙවීම් කටයුතු සිදු කර ඇත. | 2019 සිදුකළ අලුත් වැඩියාවෙහි අඩුපාඩුවක් පැවතියේදි යන්න පිළිබඳ පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් අධිකාරිය වෙත පැවරී ඇති අධීක්ෂණ හා නියාමන කාර්යයන් ක්‍රමවත් කිරීම පිණිස කර්මාන්තකරුවන් වෙත අනු අංක සහිත ස්ටිකර් ආකාර ලේබල් ක්‍රමයක් හඳුන්වා දීම අරමුණු කරගෙන අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව 2016 ත් 2018 ත් අතර කාලය තුළ රු.11,626,311 ක් වැය කර වර්ග 07 ක් යටතේ මුද්‍රණය කරන ලද ස්ටිකර් 6,573,831 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.8,358,002 ක් වටිනා සියයට 72 ක් වන ස්ටිකර් 4,725,841 ක් ඉතිරි වී තිබුණු අතර ස්ටිකර් මිලදී ගැනීම සඳහා කර්මාන්තකරුවන්ගේ උනන්දුව අඩු වෙමින් | පොල් මිල උච්ඡාවචනය වීම හා තරඟකාරී ජාත්‍යන්තර වෙළඳපොල හේතුවෙන්, සමහර කර්මාන්ත ආයතන අක්‍රිය තත්ත්වයට පත්වීම, නිෂ්පාදනයන් අඩු වීම හා කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි ලේබල් කර්මාන්තකරුවන් වෙත ලබා දීමට නොහැකි විය. කෙසේ නමුත්, ක්‍රම ක්‍රමයෙන් මෙය කර්මාන්ත වෙත අනුගත කිරීම අධිකාරියේ අරමුණයි. | අවශ්‍යතාවයන් හඳුනාගෙන සැපයුම් කිරීමටත්, ඒවා කාර්යක්ෂමව උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු අතර ස්ටිකර් ඌනතාවයන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර නිසි පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| පැවතීම හේතුවෙන් එම ඉතිරි තොගය අනාර්ථික වියදමක් විය හැකි බවට නිරීක්ෂණය කෙරේ. තවද, මුද්‍රණය කරන ලද මුළු ස්ටිකර් 6,573,831 කින් අලෙවි කළ ප්‍රමාණය 1,732,879 ක් වීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරි විය යුතු ස්ටිකර් ප්‍රමාණය 4,840,952 ක් විය යුතු වුවද, ඉතිරිව ඇති ස්ටිකර් ප්‍රමාණය 4,725,841 ක් වීමෙන් අලෙවි වටිනාකම රු.230,222 ක් වූ ස්ටිකර් 115,111 ක ඌනතාවයක් පවතින බවට නිරීක්ෂණය විය. | | . |
| (ඇ) පොල් නිෂ්පාදනයන්හි අඩංගු සීනි මට්ටම, විටමින් මට්ටම, අපද්‍රව්‍ය මට්ටම (PAH) පරීක්ෂා කිරීමත්, අපනයනය කරනු ලබන දිසිදි පොල්වල හා පොල්තෙල්වල SLS 98 : 2013 දරන ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුව පවතින ඇෆ්ලටොක්සින් පරීක්ෂා කිරීමත් අරමුණු කරගෙන 2017 වර්ෂයේදී රු.6,590,685 කට මිලදීගත් High Performance Liquid Chromo to graph (HPLC) යන්ත්‍රය සඳහා 2019 හා 2021 වර්ෂයන්හිදී තවත් රු.9,107,192 ක් වැය කර අමතර උපාංග ද මිලදීගෙන තිබූ නමුත් මිලදීගත් දින සිටම දෝෂ වාර්තා වී තිබීම හා රසායනාගාරයේ නවීකරණ කටයුතු අවසන්ව නොතිබියදී යන්ත්‍රය මිලදී ගැනීම සහ විශ්ලේෂක සේවක පුරප්පාඩු පැවතීම යනාදී කරුණු මත යන්ත්‍රය නිෂ්ක්‍රීයව තිබූ අතර 2018 වර්ෂයේදී යන්ත්‍රයේ වගකීම් කාලය ද අවසන් වී තිබුණි. තවද, තාක්ෂණික දැනුම ඇති ස්වාධීන නිලධාරියෙකු ලවා යන්ත්‍රය පරීක්ෂා නොකර සියලු ගෙවීම් සිදු කර තිබුණි. | මෙම HPLC උපකරණය 2017දී මිලදී ගත් දින සිට 2020 දක්වා පරීක්ෂණ සඳහා භාවිතා කිරීමට නොහැකි වීමට රසායනාගාර නවීකරණ කටයුතු වසර 3ක් වන තෙක් සම්පූර්ණ නොකිරීමහා 2019 – 2021 තෙක් විශ්ලේෂක සේවක පුරප්පාඩු පැවතීම හේතු විය. 2022/07/15 වන විට පරීක්ෂණ 42 ක් සිදුකර ඇත. කොරෝනා උවදුර හා ඉන්ධන සහ විදුලි බලය සැපයීමේ අර්බුදය, රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා විදේශ විනිමය හිඟය හේතුවෙන් අත්‍යාවශ්‍ය පරීක්ෂණ පමණක් සිදු කරනු ලැබේ. | යන්ත්‍ර මිලදී ගැනීමට පෙර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා පුහුණු කාර්ය මණ්ඩල පවතී ද යන්න තහවුරු කරගෙන නොමැති හෙයින් එයට වගකිව යුත්තන් හඳුනා ගැනීමට පරීක්ෂණයක් කළ යුතුය. |
| (ඇ) ජනපති පදවි ප්‍රාප්තියේ දෙවර්ෂ පූර්ණයට සුභ පැතුම් එක් කිරීමේ පුවත්පත් දැන්වීමක් නිර්මාණය කර ගැනීම සඳහා රු.75,600 ක් වැය කිරීම, රේඛීය රාජ්‍ය අමාත්‍යාංශය මඟින් මුද්‍රණය කළ 'අපේක්ෂා කප්රුක' නම් පොතේ පිටපත් 150,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.8,181,000ක් ගෙවීම අධිකාරියේ අරමුණුවලට පටහැනි බවට නිරීක්ෂණය විය. | විෂය භාර අමාත්‍යාංශය මඟින් පොල් වගාව සහ පොල් කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ ජනතාව දැනුවත් කිරීම සඳහා සිදු කර ඇත. | අධිකාරියේ අරමුණුවලට අනුකූල නොවන වියදම් නොදැරිය යුතුය.<br>විෂය භාර අමාත්‍යාංශයේ වියදම් එම අමාත්‍යාංශයට වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ)අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපසින් සභාපතිවරයා සඳහා කොටසක් එකතු කිරීම හා කොළඹ කොටුවේ පවත්වාගෙන යනු ලබන කාර්යාලයේ අලෙවිසැලක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන නොතිබියදී ඊට අදාළ සැලසුම් සකස් කිරීම සඳහා එකඟ වී තිබුණු රු.1,200,000 ක උපදේශන ගාස්තුවෙන් පළමු වාරිකය වශයෙන් පෞද්ගලික උපදේශන සමාගමකට ගෙවා තිබුණු රු.300,000 ක් එම ව්‍යාපෘතිය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොදීම හේතුවෙන් අදාළ ඉදි කිරීම් සිදු කිරීමට නොහැකි වී තිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර අධිකාරියේ අභ්‍යන්තර ඉපැයීම් හෝ අභ්‍යන්තර ඉතුරුම් යොදා ගෙන මෙම කාර්යය සිදු කිරීමට නියමිතය. මෙය විශේෂ ආයෝජන ව්‍යාපෘතියක් ලෙස පෞද්ගලික ක්ෂේත්‍රයේද සහාය ඇතිව පවත්වාගෙන යෑමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | මෙම කාර්ය සම්පූර්ණ කරවා ගත යුතුය. එය කළ නොහැකි නම් වියදම වගකිව යුත්තන්ගෙන් අය කර ගත යුතුය. |
| (ඊ) පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව ඉල්ලුම්කරුවන් විසින් යොමු කරන දිසිදි පොල්, පොල් තෙල්, කොහුබත්, ජලය, දිසිදි පොල්, පුන්නක්කු, කොප්පරා, පොල් කෙඳි ආදියෙහි ආදර්ශයන්හි පරීක්ෂාවන් සිදු කර අධිකාරියේ රසායනාගාර මඟින් දින 05 ත් දින 10 ත් අතර කාලසීමාවේදී පරීක්ෂණ වාර්තා නිකුත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ පරීක්ෂණ වාර්තා 60 ක් දින 14 ත් දින 118 ත් අතර කාලයක් ප්‍රමාද කර නිකුත්කර තිබුණු අතර පරීක්ෂණ වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් සේවක පිරිස හිඟවීම මත රසායනාගාර වෙත යොමුකෙරෙන ආදර්ශ ප්‍රමුඛතා පදනම මත ඉඩ ලැබෙන පරිදි සිදුවේ. ප්‍රමුඛ පරීක්ෂණ සිදුකරන අතරවාරයේදී නියාමන පරීක්ෂණද සිදුකළ යුතු වූ බැවින් පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වී ඇත.ඉදිරියේදී මෙවැනි තත්වයක් වළක්වා ගැනීම සඳහා තත්ත්ව පාලන අංශයේ වාර්ෂික සැලැස්මට අදාළව නියාමන ආදර්ශ යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත දිනට පරීක්ෂණ සිදු කර වාර්තා නිකුත් කිරීමටත්, වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (උ) සේවය හැර ගිය සේවකයන් දෙදෙනෙකුට 2017 හා 2020 වර්ෂයන්හි ලබාදී තිබුණු රු.434,938 ක සේවක ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රටේ පවතින අර්බුදය හමුවේ ප්‍රමාද වී වුවද සහන කාලයක් ලබාගෙන ඉහත ණය මුදල ණයකරුගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතියි. | සේවක ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතුයි. |
| (ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එක් අංශයක ලී බඩු හා උපකරණ 08 ක ඌනතාවයක් ද, තවත් අංශයක ලී බඩු හා උපකරණ 07 ක අතිරික්තයක් ද පැවතුණු නමුත් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නිසි ගැලපීම් සිදු කර නොතිබුණි. | වත්කම් තක්සේරු කිරීම සිදු කරන අවස්ථාවේ දී මෙම ගණනය කිරීමේ නිවරදිතාවය නැවත පරික්ෂා කර බලා අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | අනාවරණය වූ ඌනතාවයන් හා අතිරික්තතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොල් නිෂ්පාදන පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන සඳහා 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට රු.9,344,832 ක් ගෙවා තිබුණ ද, ප්‍රචාරණ කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ආපසු අයවිය යුතු රු.7,060,032 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට නොහැකි වීම මතභේදාත්මක කරුණක් වූ අතර මෙම ප්‍රචාරන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුවී ඇති බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිසන් සභාව හා ජනාධිපති විමර්ෂණ ඒකකය විසින් 2016 වර්ෂයේදී සිදු කළ විමර්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳව ද සොයා බලා නොතිබුණි. වැය කළ රු.2,284,800 ක මුදලින් රු.2,280,000 ක් ප්‍රචාරක පට 06 ක් නිෂ්පාදනය කිරීම සඳහා වුවද, එම ප්‍රචාරක පට විකාශනය කර නොතිබීමෙන් එම මුදල ද අනාර්ථික වියදමක් වී තිබුණි. | මෙම මුදල අයකර ගැනීමට තව දුරටත් කටයුතු කරනු ලැබේ. | සිදු කළ විමර්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත ප්‍රකාරව "දිසිදි"පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා, අපනයනය කරනු ලබන සෑම දිසිදි පොල් කි. ග්‍රෑ 1 ක් වෙනුවෙන් ශත 20 ක් බැගින් සෙස් අරමුදලින් ලැබෙන මුදල් ඒ ඒ මෝල් හිමියන් නමින් ඉතිරි කිරීමේ බැංකු ගිණුම්වල තැන්පත් කොට මෝල් සංවර්ධනය කිරීමේ අරමුණින් 1980 වර්ෂයේදී පිහිටුවා තිබුණු මෝල් සංවර්ධන අරමුදල සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා ලැබුණු සෙස් ආදායම් හා බැංකු පොලී ආදායම් එකතුව සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.99,813,314 ක් ද, බැංකු තැන්පතුවල වටිනාකමරු.208,494,784 ක්ද වූ නමුත් සමාලෝචිත වර්ෂයේදී මෝල් 04 ක් නවීකරණය කිරීම සඳහා | මෙම මුදල් මෝල් සංවර්ධනය සම්බන්ධයෙන් යෙදවීමට නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී විශේෂ අවධානයක් යොමු කරන බව දන්වමි. | අරමුදලේ කටයුතු කාර්යක්ෂම කර මෝල් සංවර්ධනය කිරීම සඳහා නිසි වැඩපිළිවෙලක් සහිතව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලබාදී තිබුණුමුදල සමුච්චිත අරමුදලින් සියයට 3 ක් වූ රු.3,216,952 ක් පමණක් වීමෙන් මෝල් සංවර්ධනය සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් නොමැති බවට නිරීක්ෂණය විය. | | |
| (ආ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ බලතල අනුව පොල් තෙල් විශාල තොගවශයෙන් මිලදී ගෙන මිල අඩු වැඩි වීම අනුව වෙළඳපොලට නිකුත් කිරීම මඟින් මිල පාලනය කිරීමේ අරමුණින් පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදල පිහිටුවා තිබුණද, 1981 වර්ෂයේ සිට මෙම වැඩ පිළිවෙල අධිකාරිය විසින් අතහැර දමා ඒ සඳහා වරායේ පවත්වා තිබුණු තෙල් ටැංකි ද වෙනත් ආයතනවලට ලබා දී තිබුණි. එසේ වුවද, 1985 වර්ෂයේ සිට හිඟහිට ඇති රු.78,865,954 කණය මුදලක් ඇතුළුව එකතුව රු.160,885,535ක අයවිය යුතු ණය ශේෂයක් ද, රු.232,281,453 ක ආයෝජන ශේෂයක් හා රු.334,956,888 කසමුච්චිත අරමුදල් ශේෂයක් ද සහිතව සමාලෝචිත වර්ෂය දක්වාම අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පැවතුණි. | පොල්තෙල් මිල ස්ථායිකරණ අරමුදල් ගිණුම ද නැවත සමාලෝචනය කරමින් ඉදිරි සැලසුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | මිල ස්ථායිකරණ අරමුදල නැවත පිහිටුවීම ගැන සලකා බැලිය යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පූර්ව සැලසුම්ගත කාර්යයක් නොවූ පොල් සංවර්ධන අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට අඩි 12X9 ප්‍රමාණයේ P5 පරාමිතිය යටතේ LED ඩිජිටල් තිරයක් ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිවිතර සපුරා රු.5,196,879 ක අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයකට පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබියදී ඊ තැපැලෙන් පසුව ලබාගත් රු.6,183,000 ක වැඩිම මිලගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් නැවත විමසා රු.4,998,000 ක මිලකට විධිමත් ගිවිසුමකින් තොරව හා කාර්යසාධන | අදාළ පිරිවිතරයන්ට අනුකූලව නියමිත ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක උපකරණයක්ද යන්න තාක්ෂණික දැනුම සහිත භාහිර පුද්ගලයෙකු මගින් නැවත වතාවක් පරික්ෂා කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කරන බවත් එසේ නොවේනම් අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව ස්වාධීන පරික්ෂණයක් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සුරක්ෂණය රු.249,900 කින් අඩුවෙන් ලබාගෙන කාර්යය පවරා ඒ සඳහා රු.999,600 ක් ගෙවා තිබුණි. සකස් කළ පුවරුව නියමිත ප්‍රමාණයෙන් යුතු එකක් බවට තහවුරු කර නොතිබීම, තැනින් තැන පලුදු වී රාමුව ඇද වී තිබීම, දර්ශනය වන වීඩියෝ අපැහැදිළි වීම හා පුවරුව ක්‍රියාත්මක කරන පාලන ඒකකය පැරණි එකක් වීම යනාදී ගැටළු හේතුවෙන්එය අලුත් තත්ත්වයේ එකක් බවට සනාථ නොවූ අතර මෙය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවූ මතභේදාත්මක ප්‍රසම්පාදනයක් බවට නිරීක්ෂණය වීය. | | |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර නොතිබියදී හා අවශ්‍යතායක් නොතිබියදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන ආකාරයට හා අරපිරිමැසුම්දායී නොවන ආකාරය විද්‍යුත් ලිපිනයට මිල ගණන් ලබා ගෙන නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සභාපති කාමරය සඳහා රු.1,314,890 ක් වැය කර රූපවාහිනී යන්ත්‍රයක්, APPLE I PAD PRO 12.9" 256 GB උපකරණයක් හා758 L බොට්ල් කූලර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. | සභාපතිවරයාගේ රාජකාරි කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වීමෙන් කාර්යසාධන ඇපකරය ලබා නොගෙන කඩිනමින් මිලදී ගැනීම සිදු කර ඇති අතර පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් විද්‍යුත් තැපැල මගින් මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |
| (ඇ) පරිගණක හා උපාංග මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මෙන් වෙන් කළ මුදල රු.3,154,000 ක් වුවද, ඊට වඩා රු.1,431,150 ක් වැඩියෙන් ගෙවා රු.4,585,150 කට පරිගණක 13 ක්, මුද්‍රණ යන්ත්‍රයක් හා උකුල් (ලැප්ටොප්) පරිගණක 13 ක් මිලදීගෙන තිබුණු අතර උකුල් පරිගණක 13 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවට යොමු නොකර අධිකාරියේ සභාපතිවරයාගෙන් අනුමැතිය මත මිල ගණන් ලබා ගැනීමේ සිට ඇනවුම් කිරීම දක්වා සියලුම ප්‍රසම්පාදන කාර්යයන් එක් දිනක් තුළ සිදු කර කාර්යසාධන සුරක්ෂණයක් ද ලබා නොගෙන මිලදී ගැනීම සිදු කර තිබුණි. | ඉදිරියේදී අමතර මිල දී ගැනීම් සිදුකරන අවස්ථාවලදි ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කළ යුතු බවට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.අමතර කොටස් සොයා ගැනීමට ඇති අපහසුව හා මිල අධික වීම සලකා මෙම මාදිලියේ පරිගණක මිලදීගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින් ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |

**3.5** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අප ජල පරික්ෂාව, දිසිදි පොල් හා පොල් තෙල් ඇතුළු පොල් නිෂ්පාදනයන්හි බැරලෝහ, අපද්‍රව්‍ය හා පෝෂක යනාදී ගුණාත්මක භාවය පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා අධිකාරිය විසින් 2008 – 2020 වර්ෂ අතර කාලය තුළ රු.35,057,502 කට මිලදීගෙන තිබුණු පරීක්ෂණඋපකරණ හා ද්‍රව්‍ය23 ක්2021 වර්ෂය අවසානය දක්වාම අභාවිතව පවතින බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් පොල් නිෂ්පාදන ප්‍රමිතියට අනුකූලව ගුණාත්මකව සිදු කරන බවට සහතික වීමේ වගකීම ඉටු කිරීමට නොහැකි වී තිබුණු අතර අධිකාරියට ආදායම් ද අහිමි වී තිබුණි. | 2015 වසරේදී ජලගැලීමට ලක් වීමත්, 2017 වසරේදී රසායනාගාර නවීකරණ කටයුතු 2019 වන තෙක්ම පැවතීමත් 2019 – 2021 කාලසීමාවේදී සියයට 62 ක සේවකපුරප්පාඩුවීමත්,කොවිඩ් වසංගත කාලසීමාව තුළ අවශ්‍ය වායුන් ආනයනය කිරීම හා මිලටගැනීමේ නොහැකියාවක් පැවතීමත්, ඇතැම් පලිබෝධනාශක වර්ග හා ඇතැම් අමතර කොටස් ආනයනය තහනම් කිරීමත්, පරීක්ෂණ සඳහා යොමුවන ආදර්ශ ප්‍රමාණය අඩුවීමත් යනාදිය හේතුවෙන් උපකරණ ක්‍රියාත්මක කිරීමට නොහැකිවී ඇත. | යන්ත්‍රෝපකරණ අපේක්ෂිත කාර්යයන්ට උපයෝජනය කළ යුතුය. |
| (ආ) අධිකාරියට අයත් මහල් 04 කින් යුක්ත වර්ග අඩි 17,866 ක් වූ කොළඹ කොටුව කාර්යාලයේ වර්ග අඩි 7,754 කින් සමන්විත පළමු මහල හා තෙවන මහල 2018 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට විකල්ප භාවිතයකින් තොරව පැවතුණි. | පොල් ආශ්‍රිත කර්මාන්තවලින් සමන්විත වෙළඳ ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.අදාළ අනුමැතීන් පරිදි ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිතව ඇත. | ගොඩනැගිලි වලින් නිසි ප්‍රයෝජන ගනිමින් කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2014 වර්ෂයටත් පෙර සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ මිලදීගත් වර්ග 33 කට අයත් රු.914,270 ක් වටිනා රසායනික ද්‍රව්‍ය තොග අභාවිතව පැවති අතර ඊට හේතු ඉදිරිපත් කර නොතිබුණි. | කොවිඩ් රෝගී තත්වය, ඉන්ධන අර්බුදය හා විදුලි ඇණහිටීම හේතුවෙන් රට අකර්මන්‍යය වීම නිසා පරීක්ෂණ සඳහා යොමුවන ආදර්ශ ප්‍රමාණයද අඩුවීමෙන් රසායනික ද්‍රව්‍ය වැයවීමද අඩුවී ඇත. | කල් ඉකුත් වීමට පෙර රසායන ද්‍රව්‍ය උපයෝජනය කළ යුතුය. අතිරික්ත තොග රැස් නොකළ යුතුය. |

**3.6** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල් සංවර්ධන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට 259 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 20 ක් වූ තනතුරු 52 ක් වසර ගණනාවක සිට | සේවයෙන් ඉල්ලා අස්වීම/විශ්‍රාම යාම හේතුවෙන් වාර්ෂිකව සැලකිය යුතු තනතුරු සංඛ්‍යාවක් පුරප්පාඩු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර |

| | | |
|---|---|---|
| පූරප්පාඩු වී පැවති අතර අධ්‍යක්ෂ(පරිපාලන) හා අධ්‍යක්ෂ (අලෙවිකරණ-ජාත්‍යන්තර) යන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 02 ක් ද ඒ අතර විය. අවශ්‍යතාවය අනුව එම පූරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019.09.27 දින පූරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර බඳවා ගැනීමේ පරිපාටිවල ආකෘති සංශෝධනය කිරීම සඳහා යොමු කර ඇත.<br>අධ්‍යක්ෂ -අලෙවිකරණ (ජාත්‍යන්තර) තනතුරෙහි අවශ්‍යතාවය තවදුරටත් සාකච්ඡා කර සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය ලබා දී ඇත. | ගැනීමට කටයුතු කළ යුතුය. |